# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

1976 දෙසැම්බර් මස 17 වැනි දින

II වන කොටස

## අතිරේකය

(76. 12. 27 වන දින නිකුත් කරන ලදී.)


# ලංකාවේ රෝමානු කතෝලික අග්‍ර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ (සංශෝධන)

ලංකාවේ රෝමානු කතෝලික අග්‍ර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනත් කෙටුම්පතකි.

ආණ්ඩුවේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

# ලංකාවේ රෝමානු කතෝලික අග්‍ර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ (සංශෝධන)

**ලංකාවේ රෝමානු කතෝලික අග්‍ර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ ආඥාපනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි.**

**පූර්විකාව.**

මෙතෙක් මහනුවර රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ අධිකරණ විෂය බල සීමාව යටතේ පැවැති ප්‍රදේශයෙන් කොටසක් බදුලු දියෝකීසිය නමින් නව දියෝකීසියක් බවට පත් කොට අතිගරු ආචාර්ය ඩොම් ලියෝ නානායක්කාර, ඕ. එස්. බී., පූජකතුමාණන් එය පාලනය කිරීම සඳහා බදුල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ වශයෙන් යථා පරිදි පත් කරනු ලැබ ඇති හෙයින් ද :

බදුල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සංස්ථාගත කිරීමට විධිවිධාන සැලැස්වනු පිණිස සහ වෙනත් කරුණු සම්බන්ධයෙන් ලංකාවේ රෝමානු කතෝලික අග්‍ර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ ආඥාපනත සංශෝධනය කිරීම අවශ්‍යානුකූල හෙයින් ද :

**ලුහුඬු නාමය.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1976 අංක දරන ලංකාවේ රෝමානු කතෝලික අග්‍ර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

3අ වන අලුත් වගන්තිය 338 වන අධිකාරයෙහි ඇතුළත් කිරීම.

2. මෙහි මින් මතු “ප්‍රධාන ප්‍රඥප්තිය” යනුවෙන් සඳහන් කරනු ලබන ලංකාවේ රෝමානු කතෝලික අග්‍ර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සහ රාජගුරු ප්‍රසාදීන් වහන්සේලා පිළිබඳ ආඥාපනතේ 3 වන වගන්තියට ඉක්බිතිව ම, 3අ වන වගන්තිය වශයෙන් බල පැවැත්විය යුතු, පහත සඳහන් අලුත් වගන්තිය ඇතුළත් කිරීමෙන් ඒ ආඥාපනත මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

“බදුල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ සංස්ථාගත කිරීම.

3අ. බදුල්ලේ රෝමානු කතෝලික රාජගුරු ප්‍රසාදීන් වහන්සේ, එනම්, අතිගරු ආචාර්ය ඩොම් ලියෝ නානායක්කාර, ඕ. එස්. බී., පූජකතුමාණන් සහ රෝමානු කතෝලික සභාවේ නීති ද ව්‍යවහාර යන් ද අනුව යථා පරිදි පත් කරනු ලබන එතුමාණන්ගේ අනුප්‍රාප්තිකයන් ද සංස්ථාවක් වන අතර එය මේ ආඥාපනතේ සියලු කාර්යයන් සඳහා බදුල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ යන නාමයෙන් හැඳින්වෙන්නේ ය. තවද එම නාමය යටතේ අවිච්ඡින්න පැවැත්මක් එයට ඇත්තේ ය. සෑම වර්ගයකම චංචල හා නිශ්චල දේපළ අත්කර ගැනීමේ, මිලට ගැනීමේ, ලබා ගැනීමේ, අයිතිව සිටීමේ හා භුක්ති විඳීමේත් එම දේපළ විකිණීමේ හෝ ඒ පිළිබඳව අන් ආකාරයකින් සුදුස්සක්

ජ 24051-6,910 (12/76)

කිරීමෙන් පූර්ණ බලය සංස්ථාවට ඇති අතර එම දේපළ සම්බන්ධයෙන් සියලු අධිකරණයන්හි සංස්ථාව විසින් නඩු පැවරීම ද සංස්ථාවට විරුද්ධව නඩු පවරනු ලැබීම ද එම නාමයෙන් කළ හැකි වන්නේ ය.".

5අ වන අලුත් වගන්තිය ප්‍රධාන ප්‍රඥප්තියෙහි ඇතුළත් කිරීම.

3. 5 වන වගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ 5අ වන වගන්තිය වශයෙන් බලපවත්වන්නේ ය :—

බදුල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ වෙත දේපළ සතු කිරීම.

5අ. ස්වකීය නිල තත්ත්වයෙන් එකී අතිගරු ආචාර්ය ඩොම් ලියෝ නානායක්කාර, ඕ. එස්. බී., පූජකතුමාණන් විසින් දැනට අත්කරගෙන ඇති, දරනු ලබන හෝ සන්තකයෙහි තබාගෙන සිටින චංචල හා නිශ්චල යන දෙවර්ගයේ ම සියලු දේපළ, ඒවා කෙරෙහි බලපාන යම් භාරයකට හෝ කොන්දේසියකට හෝ යටත්ව, එකී බදුල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේ වෙත සතු වන්නේ ය.".

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) ඒ වගන්තිය, ඒ වගන්තියේ (1) වන උපවගන්තිය වශයෙන් නැවත අංක කිරීමෙන් ; සහ

(2) නැවත අංක කළ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන් :—

"(2) බදුල්ලේ දියෝකීසිය ඇති කිරීම හේතුකොටගෙන බදුල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ පාලනයට යටත් වන චංචල වූ හෝ නිශ්චල වූ හෝ සියලු දේපළ සම්බන්ධයෙන් බදුල්ලේ රාජගුරු ප්‍රසාදීන් වහන්සේගේ වාසියට මහනුවර රාජගුරු ප්‍රසාදීන් වහන්සේ විසින් ලියා අත්සන් කරනු ලබන හිමි කිරීමේ, අන්සතු කිරීමේ හෝ පැවරීමේ කවර සාධන පත්‍රයක් වුව ද මුද්දර ආඥපනතේ "අ" උපලේඛනයේ I වන කොටසෙහි 23(7) වන කරුණ යටතේ අය කරනු ලැබීමට යටත් සාධන පත්‍රයක් වශයෙන් සලකනු ලබන්නේ ය.";